# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# ඇබෑර්තු

## සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) වෙබ් අඩවියේ පළ කර ඇති තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**කරුණාකර උක්ත තනතුරු පුරප්පාඩු සඳහා අදාළ සුදුසුකම්, රැකියා විස්තරය සහ වෙනත් අදාළ තොරතුරු පිළිබඳ වැඩිදුර විස්තර දැන ගැනීම සඳහා www.trc.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.**

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

තනතුරු සඳහා තෝරා ගැනීම, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පටිපාටිය මත පදනම් වන අතර අයදුම්කරුවන්ගේ කුසලතා තක්සේරු කිරීමේ ලිඛිත විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගැනීම් සිදු කෙරේ. මූලික පරීක්ෂාවකින් පසුව, ලිඛිත විභාගය සඳහා කැඳවනු ලබන්නේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණි. ලිඛිත විභාගයෙන් වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**කොන්ත්‍රාත් කාලය :**

වසර 01 කි

**අයදුම් කිරීමේ ක්‍රමය**

- අයදුම්පතේ ආකෘතිය www.trc.gov.lk වෙබ් අඩවිය වෙතින් බාගත කළ යුතුය.
- අදාළ ආකෘතියෙන් තොරව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
- අයදුම්පත සම්පූර්ණ හා පැහැදිලි විය යුතු අතර අවශ්‍යතා සනාථ නොකෙරෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- සියලුම අයදුම්පත් **2021.04.30 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක. 276, ඇල්විටිගල මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

**පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර, තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා බඳවා ගැනීමට නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියාමන අධිකාරියක් වන අතර, කොමිෂන් සභාවේ තනතුරක් සඳහා බඳවා ගන්නා ඕනෑම පුද්ගලයෙකු ඔහුගේ ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත්කිරීම හෝ රැකියාවක නිරතවීම සඳහා සෘජුව හෝ වක්‍රව අනුබල දීම / දිරිගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.
6. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවකයින් සිය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු අතර තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් මුදා හැරීමේ හැකියාව පිළිබඳව එහි සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**අංක. 276, ඇල්විටිගල මාවත,**
**කොළඹ 08.**